වීරකැටිය ප්‍රදේශයේ වෙඩි වැදී මියගිය සිසුවාගේ සීයා දිවි අහිමි කරගැනීමට තැත් කළ පුවතක් මාධ්‍ය තුළින් ආවරණය කර තිබිණි. එහිදී පහත කරුණු නිරීක්ෂණය කළ හැකි විණි.

1) දිවි තොර කරගැනීමට තැත් කිරීමේ පුවත මුල් පිටුවේම පළ කර ඇත. දිවි තොර කරගැනීම් වාර්තාකරණය පිළිබඳ මාධ්‍ය ආචාර ධර්ම නිර්දේශයන් තුළ සඳහන් වන්නේ, දිවි තොර කරගැනීම් පිළිබඳ පුවතක් එවැනි ප්‍රමුඛතාවයකින් පළ කිරීමෙන්, අනුකාරක දිවි තොර කරගැනීම් සිදුවිය හැකි බවයි.

2) දිවි තොර කරගැනීමට තැත් කළ ආකාරයද මෙහිදී ඉදිරිපත් කර ඇත. ඒ ඔස්සේද, එම ආකාරය භාවිතා කරමින් සිදුවන අනුකාරක දිවි තොර කරගැනීම් සිදුවිය හැකි බව මාධ්‍ය ආචාර ධර්ම පවසයි.

3) මෙම පුවත සමගින් උපකාරක අංක පළ කර නැත. මෙම දිවි තොර කරගැනීමකට තැත් කිරීම සම්බන්ධ පුවත හා හදිසි උපකාරක අංක පළ කළේ නම්, ඒ ඔස්සේ දිවි තොර කරගැනීමට නැඹුරුවක් ඇති තවත් අයෙකුගේ ජීවිතයක් බේරාගැනීමට ඉඩක් ලැබෙනු ඇත.

ඉහත කරුණු සැලකිල්ලට ගනිමින් බැලූ විට, මෙම සිදුවීම මාධ්‍ය මගින් ආවරණය කර ඇති ආකාරය සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

හදිසි උපකාරක අංක:
*CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

මූලාශ්‍ර:

https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...
https://media.samaritans.org/.../Media_Guidelines_FINAL.pdf

**#MediaEthicsSL #lka #sinhalanews #HiruTV #Mawbima #Divaina**